**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**
**නීති පීඨය**

**නීතිවේදී උපාධි පරීක්ෂණය, පළමු වසර (මාර්ගගත) - 2021**

# නීති විධික්‍රම
(පැ තුනයි )

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : **06**

ප්‍රශ්න <u>තුනකට (03)</u> **පමණක්** පිළිතුරු සපයන්න.
(අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කෙරේ.)

---

01."නීතිය ස්ථායි විය යුතු නමුත් නිශ්චලව නොනැවතිය යුතුය. එමනිසා, ස්ථාවරත්වයේ අවශ්‍යතාවය සහ වෙනස් වීමේ අවශ්‍යතාවය යන ගැටෙන ඉල්ලීම් සමථයකට පත් කිරීමට නීතිය පිලිබඳ සියලු චින්තනයන් බලවත් පරිශ්‍රමයක් දරා ඇත."

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නෙහි ද? නීති චින්තනය පිලිබඳ ගුරුකුල දෙකක් ඇසුරින් සහ නිදසුන් ගෙනහැර දක්වමින් ඔබගේ පිළිතුර සනාථ කරමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 100)

02. "එදිරිවාදී සම්ප්‍රදායේ කාර්යපටිපාටීන් යම් තරඟයකින් හෝ ආරවුලකින් තම හැඩය නිර්මාණය කර ගනී: එය යම් විනිශ්චයකට එළඹීම තම මූලික කාර්යභාරය කරගන්නා ලද සාපේක්ෂව නිෂ්ක්‍රිය තීරණ ගන්නෙක් ඉදිරිපිට විරුද්ධවාදීන් දෙදෙනෙක් අතර සිදුවන කටයුත්තක් ලෙස විස්තර කරයි. එදිරිවාදී නොවන සම්ප්‍රදාය නිළ විමර්ශනයක් ලෙස ආකෘතිගත වී පවතී."

අ.පි.බ.

මෙම පද්ධති ද්විත්ත්වයේම 'විනිසුරුවරයාගේ භූමිකාව' කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් උක්ත ප්‍රකාශයේ වලංගුතාවය පිළිබඳව විවේචනාත්මකව අදහස් දක්වන්න.

(ලකුණු 100)

03. මාත්‍රූ වනාහි, වන්දාර් රාජ්‍යයේ වෙරළබඩ ප්‍රදේශයේ ජීවත්වන, සුළුතර ධීවර ප්‍රජා කණ්ඩායමකි. පරිචයක් ලෙස, ප්‍රජාවේ සියලුම පුරුෂයන් අවුරුදු 15කට එළඹෙන විට ධීවර කටයුතුවල නිරත වනුයේ ධීවර කර්මාන්තය පිළිබඳ ප්‍රායෝගික හා තාක්ෂණික පුහුණුව ලබා ගැනීම සඳහාය.

2021 ජනවාරි මාසයේ දී, වන්දාර් රජය විසින් 1956 කාන්තාවන්, තරුණ තැනැත්තන් සහ දරුවන් පිළිබඳ පනත සංශෝධනය කරන ලදි. සංශෝධිත පනතේ [2021 අංක 2 දරණ] 9 වන වගන්තිය මඟින්: "වයස අවුරුදු දහසයට අඩු කිසිම තැනැත්තෙක්ව, කිසිදු යාත්‍රා හිමිකරුවෙකු විසින් සේවයේ නොයෙදිය යුතුය" යනුවෙන් දක්වයි. මාත්‍රූහි ග්‍රාම නිළධාරීවරයා මේ නීතියේ වෙනස්වීම පිළිබඳව ප්‍රජාවට උපදෙස් දුන්නේය. කෙසේ නමුත්, ප්‍රජාව සංශෝධිත නීතිය පිළිබඳව කලකිරීමෙන් පසුවන අතර අවුරුදු 15 ළඟා වන විට ධීවර කර්මාන්තයේ නිරත වීම, ඔවුන්ගේ සංස්කෘතියට හා ජීවනෝපායට සමීපව සම්බන්ධ වී පවතින දීර්ඝ කාලීන සම්ප්‍රදායක් බවට තර්ක කරයි. තවදුරටත්, ඔවුන් තර්ක කර සිටිනුයේ නියමිත වේලාවට නිසි පුහුණුවක් ලබා නොදුන්නහොත් ඔවුන්ගේ ධීවර කටයුතුවලට ඉන් බලපෑමක් ඇති විය හැකි බවයි. ප්‍රජාවේ වැඩිහිටි කණ්ඩායම මෙම නීතිය අභියෝගයට ලක් කිරීමට සැරසෙන අතර, චාරිත්‍රයේ වලංගුභාවය පිළිබඳව ඔබගෙන් උපදෙස් පතයි.

අදාළ නඩු තීරණ උපුටා දක්වමින් ඔවුන්ට උපදෙස් දෙන්න. වන්දාර්හි නීති පද්ධතිය ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට සමාන බවට උපකල්පනය කරන්න.

(ලකුණු 100)

04. ලේක්ලැන්ඩ් රජය විසින් '2021 අනායඅයකුගේ මිනිස් ශරීරයකට එරෙහිව සිදු කරන සියලුම ආකාරයේ අමානුෂික සහ පහත්කොට සැලකීම් තහනම් කරන පනත' නීතිගත කරන ලදි.

පනතේ 3 වන වගන්තිය දක්වන ආකාරයට:

*"කිසිඳු තැනැත්තෙකු විසින් වෙනත් තැනැත්තෙකුගේ ශරීරයට හානි කරන සහ පීඩා කරන අමානුෂික ක්‍රියාකාරකම්වල නිරත නොවිය යුතුයි."*

ලේක්ලැන්ඩ්හි පුරවැසියෙක් වන සොමායා, ආගමික වෛරයට විරුද්ධව සහ කාන්තාවන් සවිබල ගැන්වීම වෙනුවෙන් ක්‍රියාකරන කීර්තිමත් සමාජ ක්‍රියාකාරිකාවකි. ඇය විසින් සංවිධානය කළ "වෛරය නවත්වන්න. කරුණාව පතුරවන්න" යන ව්‍යාපාරය සමාජ මාධ්‍ය ආක්‍රමණය කරන ලදි. මෙයට ප්‍රතිචාරයක් වශයෙන් දේශීය ප්‍රජාවගෙන් සමන්විත කණ්ඩායමක් තර්ක කළේ සොමායාගේ ව්‍යාපාරය එක්තරා ආගමික කණ්ඩායමක් අරමුණු කරගනිමින් සමානාත්මතාවය ප්‍රවර්ධනයේ මුවාවෙන් ඇයගේ යූ ටියුබ් චැනලය ජනප්‍රිය කරගන්නා බවයි. 2021 නොවැම්බර් මාසයේ දී, ප්‍රජාවේ ඉවසීම රහිත කණ්ඩායමක් විසින් සොමායාගේ නිවසට ගිනි තබන ලද අතර එහිදී ඇය සතුව තිබූ සියලුම භාණ්ඩ, ලැප්ටොප් පරිගණකය, ලිපිලේඛන ඇතුළු අනෙකුත් තාක්ෂණික උපකරණ ද විනාශ විය. මෙම සිද්ධියෙන් පසුව, සොමායාට විරුද්ධව ක්‍රියා කල කණ්ඩායම විසින් ගිනිගත් නිවසක දර්ශන ඇතුලත් 'මොළය නොමැති ගැහැණියට දෙවියන් දුන් තෑග්ග' යන මාතෘකාව යටතේ වූ වීඩියෝ පටයක් සමාජ මාධ්‍යට මුදා හරින ලදි. 2021 දෙසැම්බර් මාසයේ දී සොමායා විසින් පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ගොනු කළේ අදාල කණ්ඩායම මෙම සිදුවීමට වගකිව යුතු වන බවට තර්ක කරමිනි. ඒ අනුව, මෙම කණ්ඩායමේ ක්‍රියාකාරීන් කිහිපදෙනෙක්ව පොලිසිය විසින් අත්අඩංගුවට ගත් අතර උක්ත පනතේ 3 වන වගන්තිය යටතේ ඔවුන්ට එරෙහිව චෝදනා ගොනු කරන ලදි. එම නීතිය යටතේ, පිළිස්සුනු නිවසක ඡායාරූප හා වීඩියෝපට මුදා හැරීම යන්න 'වෙනත් මිනිස් ශරීරයකට එරෙහිව සිදු කරන හානියක් හෝ පීඩාවක්' යන නිර්වචනය තුලට නොවැටෙන බව සැකකරුවන් තර්ක කර සිටිති. එම සිදුවීම සම්බන්ධව ඔවුන් නොදන්නා බවත්

කිසිඳු ගිනි තැබීමේ කටයුත්තක තමන් නිරත නොවූ බවත් අදහස් ප්‍රකාශ කිරීම පමණක් සිදු කළ බවත් ඔවුන් තවදුරටත් දක්වයි.

මෙම නඩුව අසනු ලබන විනිසුරු ඔබ යැයි උපකල්පනය කරමින්, ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අර්ථ නිරූපණය කිරීමේදී ඔබ විසින් අදාළ කරගනු ලබන අර්ථ නිරූපණ රීතින් සාකච්ඡා කරන්න. ලේක්ලැන්ඩ්හි නීති පද්ධතිය ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට සමාන වන බවට උපකල්පනය කරන්න.

(ලකුණු 100)

05. X, Y සහ Z යන කරුණු මත පදනම් වූ නඩුවක් ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ත්‍රිපුද්ගල විනිශ්චය මණ්ඩලයක් ඉදිරිපිට විභාග වෙමින් පවතී. ඔබගේ පිළිතුර සනාථ කිරීමට උචිත අධිකාරීන් උපුටා දක්වමින්, පහත නඩු තීරණවල අදාළත්වය සාකච්ඡා කරන්න:

(අ) X, Y සහ Z කරුණු මත පදනම්ව 2019 දී අභියාචනාධිකරණයේ ත්‍රිපුද්ගල විනිසුරු මණ්ඩලයක් ලබා දුන් තීරණයක්;

(ආ) X, Y සහ Z කරුණු මත පදනම්ව ශ්‍රේෂ්ඨාධිකරණයේ පූර්ණ විනිශ්චාසනයක් 2018 දී ලබා දුන් තීරණයක්;

(ඇ) X, Y සහ Z කරුණු මත පදනම්ව ඉන්දියාවේ ශ්‍රේෂ්ඨාධිකරණය 2011 නොවැම්බර් මස දී ලබා දුන් තීරණයක්; සහ

(ඈ) X, Y සහ Z කරුණු මත පදනම්ව ලංකාවෙන් ඉදිරිපත් වූ අභියාචනයකට ප්‍රිවි කවුන්සිලය (රාජාධිකරණය) ලබා දුන් තීරණයක්.

(25×4=100 ලකුණු)

අ.පි.බ.

06. ශ්‍රී ලංකාවේ වර්තමාන ආරවුල් නිරාකරණය කිරීමේ විකල්ප යාන්ත්‍රණය (ADR) පශ්චාත් කොවිඩ් 19 වකවානුවේ දී නවීකරණය කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීම උදෙසා අධිකරණ අමාත්‍යාංශය විසින් පත් කරන ලද අනු-කමිටුවේහි ඔබ සාමාජිකයෙක් වන බවට උපකල්පනය කරන්න. සමථකරණය හා බේරුම්කරණය යන ද්විත්වය කෙරෙහි පමණක් සන්ධර්භමය අවධානය සීමාන්තිකව යොමුකරමින්, අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ ප්‍රායෝගික නිදසුන් ගෙනහැර දක්වමින් නීති ප්‍රතිසංස්කරණ යෝජනා කෙටුම්පතක් පිළියෙළ කරන්න.

(ලකුණු 100)

*****